# 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

[සහතිකය සටහන් කළේ 1988 ජනවාරි මස 27 වන දින]

**එල්. ඩී.—ඕ. 66/80**

**පළාත් සභාවල මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. **ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

## I වන කොටස

### ප්‍රාරම්භය

2. මේ පනතේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ කොටසේ විධිවිධාන යටතේ පිහිටුවන ලද සෑම පළාත් සභාවකටම අදාළ විය යුතු ය. **පනත අදාළවීම.**

3. (1) සෑම පළාත් සභාවක්ම, එම පළාත් සභාව පිහිටුවනු ලැබුවේ, යම් පළාතක් සඳහා ද ඒ පළාත තුළ පිහිටි සියලුම පරිපාලන දිස්ත්‍රික්කවලින්, (3) වන උපවගන්තිය යටතේ වූ තීරණවලට අනුව පත් කර එවීමට හිමිකම් ඇති මුළු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවට දෙකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවෙන් සමන්විත විය යුතු ය. **පළාත් සභාවල මන්ත්‍රී ධුරය.**

(2) පළාතක සෑම පරිපාලන දිස්ත්‍රික්කයක්ම, ඒ පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව සඳහා ඡන්ද විමසීමේ කාර්ය සඳහා ඡන්ද ප්‍රදේශයක් විය යුතු ය.

(3) පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවට, ඒ පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව, කොමසාරිස්වරයා විසින් පහත දැක්වෙන පදනම මත තීරණය කරනු ලැබිය යුතු ය :—

(අ) ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ සෑම පදිංචිකරුවන් 40,000 කටම එක් මන්ත්‍රීවරයෙකි. මේ ඡේදය යටතේ තීරණයක් කිරීමේ කාර්යය සඳහා, ඉකුත් මහ සංගණනයට අනුව, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ තත් කාලයෙහි පදිංචිව සිටින තැනැත්තන්ගේ මුළු සංඛ්‍යාව ආසන්න 40,000 ට ගණන් ගත යුතු ය; තව ද

—ඒ 100843—18,890(87/12)

(6) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් හේතුව යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන වෙන වෙන ම දැක්වෙන ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කළ යුතු අතර යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට ඒ ප්‍රකාශය පිටපත් කර ගැනීමට ඔහුට ඉඩ දිය යුතු ය.

(7) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව වචනයෙන් මෙන් ම ඉලක්කමෙන් දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් ද, එම එක් එක් පක්ෂය හෝ කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද සෑම අපේක්ෂකයකු වෙනුවෙන් ම සඳහන් කොට ඇති මනාප ඡන්ද සංඛ්‍යාව වචනයෙන් මෙන් ම ඉලක්කමෙන් දැක්වෙන වෙනම ප්‍රකාශයක් ද ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය. ඒ එක් එක් ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු අතර, සහායකයන් සහ ලිපිකරුවන් අතරින් එක් කෙනකු විසින් ද, පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමැත්ත දක්වන යම් පක්ෂයක හෝ කණ්ඩායමක ගණන් කිරීමේ නියෝජිතයන් විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය.

(8) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු වෙනුවෙන්, ඡන්ද දායකයකු විසින් තම ඡන්ද පත්‍රිකාවෙහි සඳහන් කරන ලද මනාපය, එම පක්ෂය හෝ කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් තුන් දෙනෙකුට වැඩි ගණනක් වෙනුවෙන් එම ඡන්ද දායකයා මනාපය සඳහන් කොට ඇත්නම්, නොසලකා හරිනු ලැබිය යුතු ය.

(9) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයකු වෙනුවෙන්, ඡන්ද දායකයකු ස්වකීය ඡන්ද පත්‍රිකාවෙහි එක් මනාපයකට වැඩියෙන් මනාපය සඳහන් කරනු ලබන අවස්ථාවක, එසේ සඳහන් කරන ලද සියලු මනාපයන්, එක් මනාපයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

(10) මනාපය සඳහන් කරන ලද්දේ කිනම් අපේක්ෂකයාට ද යන්න පිළිබඳව අවිනිශ්චිත භාවය නිසා අවලංගු වන තම ඡන්ද පත්‍රිකාවෙහි, ඡන්දදායකයකු විසින් සඳහන් කරන ලද යම් මනාපයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

ඡන්ද පත්‍රිකා බැහැර කිරීම.

**61.** (1) 53 වන වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද පැකැට්ටු සහ සියලු ලේඛන ඒවා ලැබුණු දින සිට ගණන් ගනු ලබන මාස හයක කාලයක් තේරීම් භාර නිලධරයා විසින් තබා ගත යුතු අතර, ඉනික්බිතිව කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරතහොත් මිස, තේරීම් භාර නිලධරයා විසින් ඒ පැකැට්ටු සහ ලේඛන විනාශ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) මේ පනතින් නියම කර ඇති පරිදි මුද්‍රා තබා ඇති ඡන්ද විමසීම හා සම්බන්ධ යම් ඡන්ද පත්‍රිකාවක් හෝ වෙනත් ලේඛනයක්, අවශ්‍යාවෝචිත යයි අභියාචනාධිකරණය විසින් සලකනු ලබන යම් වේලාවක දී සහ ස්ථානයක දී සහ අවශ්‍යාවෝචිත යයි ඒ අධිකරණය සලකනු ලබන යම් කොන්දේසිවලට යටත්ව පරීක්ෂා කරන ලෙස, පිටපත් කරන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස ඒ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. එහෙත්, ඒ පරීක්ෂා කිරීම, පිටපත් කිරීම හෝ ඉදිරිපත් කිරීම ඡන්ද විමසීම හා සම්බන්ධ නඩුවක් හෝ වෙනත් යම් නඩු කටයුතු පැවරීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස, එවැනි ආඥාවක් කරනු නො ලැබිය යුතු ය. එවැනි යම් ඡන්ද පත්‍රිකාවක් හෝ ලේඛනයක් තේරීම් භාර නිලධරයාගේ භාරයේ තිබෙන අතරතුර ඒ ඡන්ද පත්‍රිකාව හෝ ලේඛනය, ඉහත කී පරිදි හැර, පරීක්ෂා කිරීමට කිසිම තැනැත්තකුට ඉඩ දෙනු නො ලැබිය යුතු ය.

ප්‍රතිලාභ ආසන.

**61අ.** (1) මේ පනත යටතේ පවත්වන ලද මහා ඡන්ද විමසීමක දී පළාතෙහි සියලු පරිපාලන දිස්ත්‍රික්කවලින් තෝරා පත්කර ගත යුතු පළාත් සභාවක සියලු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව, පළාතේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද ලිඛිත ප්‍රකාශවලින්, පළාතේ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට දී ඇති ඡන්ද සංඛ්‍යාව කොමසාරිස්වරයා විසින් එකතු කර නිශ්චය කළ යුතු ය.

(2) පළාතෙහි වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබන පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ අපේක්ෂකයන් අතුරෙන් තවත් දෙදෙනකු පළාත් සභාවේ මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරවා ගැනීමට හිමිකම ඇත්තේ ය. (1) වන උපවගන්තිය යටතේ තමාගේ නිශ්චය කිරීමෙන් අනතුරුව, කොමසාරිස්වරයා විසින් පළාතෙහි වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ඇති පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට, ඒ දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම ඒ පළාත් සභාවට තෝරා පත්කර ගැනීම සඳහා නාමයෝජනා කර ඇත්තා වූ ද ඒ පළාත් සභාවට තෝරා පත්කරගෙන නොමැත්තා වූ ද අපේක්ෂකයන් අතුරෙන් දෙදෙනකු පළාත් සභාවේ මන්ත්‍රීධුර සඳහා නම් කරන ලෙස, නියම කළ යුත්තේ ය. එසේ ලේකම්වරයාගෙන් හෝ කණ්ඩායම් නායකයාගෙන් නාමයෝජනා ලැබුණු විට, එම නාමයෝජනායෙහි නම් කර ඇති තැනැත්තන් පළාත් සභාවේ මන්ත්‍රීවරයන්

ලෙස තෝරා පත් කර ගන්නා ලදැයි කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, ඔවුන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කිරීමට ද සැලැස්විය යුත්තේ ය.

## V වන කොටස

### පුරප්පාඩු පිරවීම

**62.** (1) පනතේ 9 වන වගන්තියේ විධිවිධාන අනුව යම් විධි විධානයක් හෝ පළාත් සභා පනතේ විධිවිධාන අනුව යම් විධි විධානයක් හෝ ක්‍රියාත්මක වීමේ හේතුවෙන් පළාත් සභාවක යම් මන්ත්‍රීවරයකු ඒ සභාවේ මන්ත්‍රීවරයකු ලෙස අසුන් ගැනීමට හෝ එහි දී ඡන්දය දීමට නුසුදුස්සකු වන අවස්ථාවක, ඒ හේතුවෙන් ම, ඔහුගේ අසුන හෝ ධුරය හිස් වන්නේ ය. *මන්ත්‍රී ධුරය අත් හැරීම.*

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් පරිපාලන දිස්ත්‍රික්කයකින් තෝරා පත් කර ගනු ලැබූ පළාත් සභා මන්ත්‍රීවරයකුගේ අසුන හෝ ධුරය හිස් වූ අවස්ථාවක, ඒ හිස් වූ අසුන හෝ ධුරය පිරවීමේ කාර්යය සඳහා 65 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**63.** (1) පළාත් සභාවක මන්ත්‍රීවරයකු ඔහු එසේ මන්ත්‍රීවරයකු වූ අවස්ථාවේ දී ඔහුගේ නම ඇතුළත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා පත්‍රයේ ද ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ සාමාජිකයකුව සිටීම, ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හෝ අන් හේතුවක් නිසා හෝ අවසන් වූ අවස්ථාවක, ඔහු එසේ සාමාජිකයකුව සිටීම අවසන් වූ දින සිට එක් මාසයක කාලසීමාවක් ඉකුත් වූ විට, ඔහුගේ අසුන හිස් වන්නේ ය : *පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක සාමාජිකයකු වීම අවසන් වීම මත ධුරය හිස් වීම.*

එසේ වුව ද පළාත් සභාවක මන්ත්‍රීවරයකු පහ කරනු ලැබූ අවස්ථාවක ඉහත කී මාසයක කාලසීමාව ඉකුත් වීමට පෙර ඔහු අභියාචනාධිකරණය වෙත ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඉල්ලීමක් කළහොත් සහ ඒ පහ කිරීම වලංගු නොවන බව ඒ ඉල්ලීම මත අභියාචනාධිකරණය විසින් තීරණය කළහොත් ඔහුගේ අසුන හිස් නොවන්නේ ය. ඒ පෙත්සම අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් තිදෙනකු විසින් විභාග කළ යුතු අතර ඒ පෙත්සම, ඉදිරිපත් කළ තැන් පටන් මාස දෙකක කාලසීමාවක් ඇතුළත අභියාචනාධිකරණයේ තීරණය දෙනු ලැබිය යුත්තේ ය. ඒ පහ කිරීම වලංගු බව අභියාචනාධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක ඒ තීරණයේ දින සිට එම පුරප්පාඩුව ඇති විය යුතු ය.

(2) පරිපාලන දිස්ත්‍රික්කයකින් තෝරා පත් කර ගනු ලැබූ පළාත් සභාවක මන්ත්‍රීවරයෙකුගේ අසුන (1) වන උපවගන්තිය හෝ පළාත් සභා පනතේ විධිවිධාන හෝ ක්‍රියාත්මකවීමෙන් හිස් වූ අවස්ථාවක, ඒ පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් 65 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය.

ඡන්ද පෙත්සම් අභියාචනාධිකරණය විසින් විභාග කළ යුතු බව.

**93.** මේ පනත යටතේ පවත්වන ඡන්ද විමසීම් සම්බන්ධයෙන් වන ඡන්ද පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය අභියාචනාධිකරණයට ඇති අතර ඒ අධිකරණය විසින් ඒ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ ය. මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණයේ බලතල හා සම්බන්ධ එහි අධිකරණ බලය එම අධිකරණයේ සභාපතිවරයා විසින් හෝ ඒ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එම අධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. "මැතිවරණ විනිශ්චයකාරවරයා" පිළිබඳව මේ පනතේ ඇති සඳහන ඒ අනුව අර්ථ නිරූපණය කළ යුතු ය.

ඡන්ද පෙත්සමක් විභාග කළ යුතු ස්ථානය.

**94.** ඡන්ද පෙත්සමක විභාගය පවත්වනු ලැබිය යුතු ස්ථානය ඒ පෙත්සම අදාළ වන්නේ යම් පරිපාලන දිස්ත්‍රික්කයකට ද ඒ පරිපාලන දිස්ත්‍රික්කය තුළ හෝ ඊට හැකිතාක් ආසන්නව විය යුතු ය.

පෙත්සමක් ඉදිරිපත් කළ හැක්කේ කවරකු විසින් ද යන වග.

**95.** පහත සඳහන් තැනැත්තන්ගෙන් යම් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් ගණනක් විසින් අභියාචනාධිකරණය වෙත ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එනම්:—

(අ) ඒ ඡන්ද විමසීමේ දී තේරී පත්වූ බව ප්‍රකාශ කරනු ලැබීම හෝ තෝරා පත් කර ගනු ලැබීමට අයිතිවාසිකමක් තුබූ බවට හිමිකම් පාන යම් තැනැත්තෙක් ;

(ආ) ඒ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු වී සිටියේ යයි කියා සිටින යම් තැනැත්තෙක්.

හිමිකම් පෑ හැකි සහන.

**96.** පෙත්සම්කරු හිමිකම් ලබා සිටිය හැකි පහත දැක්වෙන සහන සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ ඡන්ද පෙත්සමකින් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය. එනම්:—

(අ) යම් පරිපාලන දිස්ත්‍රික්කයක් හා සම්බන්ධ ඡන්ද විමසීම අවලංගු බවට වූ ප්‍රකාශයක් ;

(ආ) තෝරා පත් කර ගනු ලැබූ යම් තැනැත්තකු තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබීම අයථා බවට වූ ප්‍රකාශයක් ;

(ඇ) යම් අපේක්ෂකයකු යථා පරිදි තෝරා පත් කරගනු ලැබූ බවට හා ඔහු තේරී පත් වූ බව ප්‍රකාශ කරනු ලැබීමට නිඹුණු බවට වූ ප්‍රකාශයක්.

පෙත්සමක පාර්ශ්වකරුවෝ.

**97.** (1) ඡන්ද පෙත්සමක පෙත්සම්කරුවකු විසින්—

(අ) තේරී පත්වූ බවට ප්‍රකාශ කරනු ලැබූ අපේක්ෂකයන් සියලු දෙනාගේ ම හෝ ඔවුන් අතුරින් යම් අපේක්ෂකයකුගේ හෝ තෝරා පත් කර ගැනීම අවලංගු බව හෝ අයථා බව කියා සිටීමට අමතරව තමා ම හෝ වෙනත් යම් අපේක්ෂකයකු හෝ යථා පරිදි තෝරා පත් කර ගනු ලැබූ බවට වැඩිදුරටත් ප්‍රකාශයක් කරන ලෙස තම ඡන්ද පෙත්සම මඟින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක, පෙත්සම්කරු හැර තරග කළ සියලු ම අපේක්ෂකයන් සහ එවැනි වැඩිදුරටත්

අධිකරණයට ඔප්පු කර ඇති බව මැතිවරණ විනිශ්චයකාරවරයා විසින් වැඩිපුරට වාර්තා කරනු ලැබුවා වූ අවස්ථාවක, ඒ අපේක්ෂකයා තෝරා පත්කර ගැනීම ඒ වාර්තාවේ සඳහන් කර ඇති වැරදි හේතුවෙන්, නිෂ්ප්‍රභ නොවිය යුතු අතර ඒ අපේක්ෂකයා, මේ පනත යටතේ කිසිදු අශක්තතාවකට පාත්‍ර නොවිය යුතු ය.

අහිංසක ක්‍රියාවන් නීති විරෝධී ක්‍රියාවක් වීමෙන් බැහැර කිරීමට අධිකරණයට ඇති බලය.

**114.** ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන්—

(අ) ඡන්ද විමසීමක දී අපේක්ෂකයකුගේ හෝ ඔහුගේ යම් නියෝජිතයන්ගේ හෝ වෙනත් තැනැත්තකුගේ හෝ ක්‍රියාවක් නැතහොත් නොකර හැරීමක්, මේ වගන්තිය නිසා නොවේ නම් මේ පනත උල්ලංඝනය වන පරිදි වූ ගෙවීමක් සේවයේ යොදවා ගැනීමක්, සේවයේ නියුක්ත කිරීමක් හෝ ගිවිසුමක් වීමේ හේතුවෙන්, නැතහොත් මේ පනතේ කවර හෝ විධිවිධානයක් අන්‍යාකාරයකින් උල්ලංඝනය කිරීමක් වීමේ හේතුවෙන්, නීති විරෝධී ක්‍රියාවක් විය හැකිව තිබුණු බව ; සහ

(ආ) එවැනි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, අනවධානය හෝ අශුද්ධ අයථා ගණනය නැතහොත් ඒ සමාන ස්වභාවයක වෙනත් යම් සාධාරණ හේතුවක් නිසා උද්ගත වූ බව සහ කිසිසේත් ම සද්භාවයෙන් තොරවීමක් නිසා උද්ගත නොවූ බව

ප්‍රමාණවත් යැයි මැතිවරණ විනිශ්චයකාරවරයකුට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුට පෙනී යන සාක්ෂි මඟින්, ඒ විනිශ්චයකාරවරයකුට පෙන්වා දෙනු ලැබූ සහ මේ පනත යටතේ ඒ ක්‍රියාවෙහි හෝ නොකර හැරීමෙහි කිසිම විපාකයකට, ප්‍රශ්නයට අදාළ අපේක්ෂකයා සහ ඔහුගේ නියෝජිතයා හෝ වෙනත් තැනැත්තා හෝ ඔවුන් අතුරෙන් කිසිවකු පාත්‍ර නොවීම යුක්ති සහගත බව කරුණු කියා සිටීමට, අපේක්ෂකයන්ට, තේරීම් භාර නිලධරයාට සහ මැතිවරණ දිස්ත්‍රික්කය ඇතුළත කවර හෝ ඡන්ද හිමියකුට අවස්ථාවක් දීමෙන් පසුව අවස්ථාගත කරුණු අනුව ඒ විනිශ්චයකාරවරයාට පෙනී යන්නා වූ අවස්ථාවක, මේ පනතේ විධිවිධානවලට ව්‍යතිරේකයක් කරනු නොලැබී නම්, නීති විරෝධී ක්‍රියාවක්, ගෙවීමක්, සේවයේ නියුක්ත කිරීමක් හෝ කුලියට ගැනීමක් බවට පත් වන්නා වූ ඒ ක්‍රියාව හෝ නොකර හැරීම, මේ පනතේ විධිවිධානවලට ව්‍යතිරේකයක් වීමට ඉඩ හරින ආඥාවක්, ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබිය හැකි අතර, එසේ ආඥා කරනු ලැබූ විට, ඒ අපේක්ෂකයා, නියෝජිතයා හෝ තැනැත්තා, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ වන කිසිම විපාකයකට පාත්‍ර නොවිය යුතු ය.

ජාතික හැඳුනුම්පත.

**128.** මේ පනත යටතේ ඡන්ද විමසීමක කිසිම අපේක්ෂකයකුට හෝ ඒ ඡන්ද විමසීමේ කාර්ය සඳහා පත් කරන ලද ඡන්ද ස්ථාන නියෝජිතයකුට හෝ ගණන් කිරීමේ නියෝජිතයකුට හෝ වෙනත් නියෝජිතයකුට හෝ, ඔහු, ඔහුගේ ජාතික හැඳුනුම් පත පැළඳගෙන ඇත්නම් මිස නාමයෝජනා භාර ගන්නා ස්ථානයට හෝ ඡන්ද මධ්‍යස්ථානයකට හෝ ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට හෝ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සඳහා වන මධ්‍යස්ථානයකට හෝ ඇතුළු වීමට හෝ ඒ ස්ථානයක රැඳී සිටීමට හෝ ඉඩ නොදිය යුතු ය.

මේ පනත යටතේ පැවැත්වෙන ප්‍රථම ඡන්ද විමසීම සම්බන්ධයෙන් අදාළ වන විශේෂ විධිවිධාන.

**128අ.** මේ පනතේ මීට ඉහතින් ඇති විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණද, මේ පනතේ විධිවිධාන, මේ පනත යටතේ පැවැත්වෙන ප්‍රථම පළාත් සභා ඡන්ද විමසීම සම්බන්ධයෙන්, මෙහි පහත සඳහන් මද වෙනස් කිරීම්වලට යටත්ව අදාළ වන්නේ ය :—

එනම්—

(අ) 15 වන වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට, මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරනු ලැබුවාක් සේ :—

"(3) ස්වාධීන කණ්ඩායමක් විසින් යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා නාම යෝජනා කරන ලද කිසිම අපේක්ෂකයකු, ඒ පරිපාලන දිස්ත්‍රික්කයෙන්, පළාත් සභාවට තෝරා පත් කර ගනු නොලැබූ අවස්ථාවක, ඒ කණ්ඩායමේ අපේක්ෂකයන් වෙනුවෙන් තබන ලද තැන්පත් මුදල රජය සන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, තේරීම් භාර නිලධරයා විසින් තැන්පත් ගිණුමෙන් ඒකාබද්ධ අරමුදලට ඒ මුදල මාරු කළ යුතු ය ; තවද, අනෙක් සෑම අවස්ථාවක දීම, ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, ඒ තැන්පත් මුදල එසේ තැන්පත් කළ තැනැත්තාට ආපසු දෙනු ලැබිය යුතු ය".

(ආ) 58 වන වගන්තිය වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබුවාක් සේ :—

"ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

**58.** (1) (අ) 53 වන වගන්තියෙහි සඳහන් ලේඛන භාර ගැනීමෙන් පසු, (තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබූ ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ මධ්‍යස්ථානවල ගණන් කිරීමේ නිලධරයන් ද ඇතුළුව) සියලුම ගණන් කිරීමේ නිලධරයන් විසින් 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තමා වෙත සපයන ලද ප්‍රකාශවලින්, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව සහ ඒ එක් එක් පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් සඳහන් කොට ඇති මනාප ඡන්ද සංඛ්‍යාව ද තේරීම් භාර නිලධරයා විසින් එකතු

"ඊ" ආකෘතිය

41 වන වගන්තිය

———— පළාත් සභාව

———— පරිපාලන දිස්ත්‍රික්කය

———— (ලිපිනය) පදිංචි ———— (සම්පූර්ණ නම) වන මම, මෙ පරිපාලන දිස්ත්‍රික්කයෙන් පළාත් සභාව සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා වන මෙ ඡන්ද විමසීමෙදී මෙහි දී හෝ වෙනත් ස්ථානයකදී ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

.........................................................

(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19 ......ක් වූ ........... මස ...... වන දින වූ මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

.........................................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

පළාත් සභාව :————.
පරිපාලන දිස්ත්‍රික්කය :————.
ඡන්ද ප්‍රදේශය :————.
ඡන්ද කොට්ඨාශය :————.
ඡන්ද පොළ————.

" උ " ආකෘතිය

41 වන වගන්තිය

ප්‍රකාශය

————පළාත් සභාව

————පරිපාලන දිස්ත්‍රික්කය

————(ලිපිනය) පදිංචි————(සම්පූර්ණ නම) වන මම, පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ පවත්වනු ලබන මෙ ඡන්ද විමසීමෙ දී ඡන්දය දීමට නීතියෙන් අශක්නුතාවකට පත්ව හෝ නුසුදුසු බවට පත්ව හෝ නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

————

(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ)

19————ක් වූ————මස————වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී

————

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

පළාත් සභාව :————.

පරිපාලන දිස්ත්‍රික්කය :————.

ඡන්ද ප්‍රදේශය ;————

ඡන්ද කොට්ඨාශය :————.

ඡන්ද පොළ ;————.

